


# වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්
# வருடாந்த செயலாற்று அறிக்கையும் கணக்கறிக்கையும்
# ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS
# 2015

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර
## மாவட்ட செயலகம் – அம்பாறை
## DISTRICT SECRETARIAT-AMPARA

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්
# வருடாந்த செயலாற்று அறிக்கையும் கணக்கறிக்கையும்
# ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS
# 2015

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
## மாவட்ட செயலகம் – அம்பாறை
## DISTRICT SECRETARIAT-AMPARA

## පෙළ ගැස්ම


| අනු අංකය | විස්තරය | පිටු අංක |
|---|---|---|
| **1.0** | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය** | |
| 1.1 | දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය | 03 |
| 1.2 | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය දැක්ම,මෙහෙවර ප්‍රකාශය හා අගයන් | 04 |
| 1.3 | අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම | 5-6 |
| 1.4 | අම්පාර දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු | 07 |
| 1.5 | .දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධ ආයතන | 08 |
| 1.6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සංවිධාන ව්‍යුහය | 09-10 |
| 1.7 | ආයතන හා පරිපාලන සම්බන්ධීකරණ අංශයේ කාර්ය භාරය | 11 |
| 1.8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්ය මණ්ඩල සංයුතිය | 12-13 |
| 1.9 | දිසාපති කාර්යාලයට අයත් රජයේ නිවාස පිළිබඳ විස්තර | 14 |
| 1.10 | සංචාරක නිවාසය සම්බන්ධ තොරතුරු | 14 |
| 1.11 | සංචාරක නිවාසයේ අයකිරීම් සම්බන්ධ තොරතුරු | 15 |
| 1.12…. | සංචාරක නිවාසයේ ආදායම් වාර්තාව | 16 |
| **02.** | **ජනගහනය** | |
| 2.1. | අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ භාවය අනුව | 16 |
| 2.2. | අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වයස් කාණ්ඩ අනුව | 17 |
| 2.3. | අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනවර්ග අනුව | 18 |
| 03. | **කෘෂිකර්මාන්තය** | |
| 3.1. | 2012 වී අස්වැන්න පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් | 20-21 |
| 3.2. | 2012 අතිරේක ආහාර බෝග හා ස්ථිර බෝග පිළිබඳ විස්තර | 22-24 |
| **04.** | **අධ්‍යාපන** | |
| 4.1 | පාසැල් පාවැත්වෙන ආකාරය හා මාධ්‍යය | 25 |
| 4.2 | ජාතික පාසැල් - 2015 | 26 |
| 4.3 | පළාත් පාසැල් - 2015 | 27 |
| 4.4 | අධ්‍යාපන කලාප වලට අයත් ප්‍රාදේශීය මට්ටමේ පාසැල් සහ අධ්‍යාපන කොට්ඨාශ - 2015 | 28 |

05.සංවර්ධන ක්‍රියාකාරකම්

5.1. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - 121 29

5.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර - ශීර්ෂය - 270 30

5.3. වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 31

5.4.දිස්ත්‍රික් සමෘද්ධි අංශය පිළිබඳ සාරාංශ වාර්තාව සමෘධි ඒකකයේ ක්‍රියාකා 32

5.6 සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයීය තොරතුරු 33-34

5.7නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයීය තොරතුරු 35

5.8ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් 36

5.10සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් 37

6.0 **විසර්ජන ගිණුම**

6.1 ගිණුම් (මුදල්) අංශයේ කටයුතු 38

6.2. ගිණුම අංශයේ (මුදල් පාලන) කටයුතු 39

….6.3 ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් 40

6.4 වැඩසටහන් අංකය හා නාමය : 1.මෙහෙයුම් වැඩසටහන 41-42

6.5ව්‍යාපෘති අනුව මූලධන වියදම - 2015 43

6.6 වියදම් මූල්‍යකරණය - 2015 44-45

6.7 අත්තිකාරම් සහ තැන්පතු සඳහා වූ පාලන ගිණුම් වල සාරාංශය - 2015 46

6.8. රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන 47

# 1

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය

## 1.1 දිසාපතිතුමාගේ පණිවුඩය



2015 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යය සාධන වාර්තාව නිකුත් කිරීම ගැන මා ඉතාමත් සතුටට පත්වෙමි.
මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් පරිපාලන අරමුණු සඳහා ස්ථාපිත කොට ඇත.

අම්පාර දිස්ත්‍රික්කය නැගෙනහිර පළාත් පොලොන්නරුව සහ මඩකලපුව උතුරු මායිම වශයෙන් ද බෙංගාල බොක්ක නැගෙනහිර මායිම වශයෙන් හම්බන්තොට සහ මොනරාගල දිස්ත්‍රික් ද දකුණු මායිම වශයෙන් බදුල්ල සහ මාතලේ දිස්ත්‍රික් බටහිර මායිම වශයෙන් දරමින් පිහිටා ඇත.මෙහි ඉඩම් ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 4415 ක් වේ.

අංක 402 හා 2002.09.12 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍ර ලේඛණයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටුකරන ලද ඉතා වැදගත් සේවාවන් හා මුදල් භාවිතයේ දක්ෂතාවයද පදනම් කරගෙන මෙම වාර්තාව පිළියෙල කරන ලදි.

අම්පාර දිස්ත්‍රික්කයේ ආර්ථික සමාජීය, සංස්කෘතික හා සදාචාර සංවර්ධනය උදෙසා පරිපාලනමය කටයුතු වලදී අවශ්‍ය සහය නොඅඩුව ලබා දුන් දිස්ත්‍රික්කයේ සියළුම ආගමික නායකයින්ටද මහජන නියෝජිතයින්ටද,

දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම මෙන්ම ඵලදායී සේවාවක් ලබා දීම සඳහා මට සහයෝගය ලබා දුන් අතිරේක දිස්ත්‍රික් ලේකම්, ප්‍රධාන ගණකාධිකාරි, ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, සහකාර දිස්ත්‍රික් ලේකම් ගණකාධිකාරි, ඉංජිනේරු, පරිපාලන නිළධාරි ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටද

දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්ට සහ එම කාර්ය මණ්ඩල වලටද අනෙක් සියළුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වලටද හා මහජනතාව වෙනුවෙන් අතිවිශාල කාර්ය භාරයක් ඉටු කිරීමට නන් අයුරින් සහය ලබාදුන් අනෙකුත් සියළුම දෙනාට මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පුද කරමි.

තුසිත පී. වනිගසිංහ,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

## 1.2.අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර ප්‍රකාශය හා අගයන්

**දැක්ම**

විශිෂ්ටතම රාජ්‍ය සේවාව තුළින් තෘප්තිමත්ම සේවාලාභින් බවට දිගාමඩුලු ජනතාව පත්කිරීම.

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්ති හා නීති රෙගුලාසි වලට අනුකූලව පවත්නා භෞතික,මානව,මූල්‍ය සම්පත් උපරිම ඵලදායිත්වයකින් හැසිරවීම තුළින් විවිධ උප සංස්කෘතීන්ට අයත් දිගාමඩුලු වාසීන් අතර සාමය, සමඟිය, සහජීවනය වර්ධනය වන අන්දමේ සුහදශීලි සේවාවක් කාර්යක්ෂමව ලබාදීම හා එබඳුම සේවාවක් දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් ලබාගත හැකිවන පරිදි එම ආයතන වලට අවශ්‍ය උපදේශකත්වය, මග පෙන්වීම,සහය දීම හා ආදර්ශය සපයමින් සමස්ථ දිස්ත්‍රික් පරිපාලනය මෙහෙයවීම.

**අපේ අගයන්**

- සුහදව ඇමතීම.
- සේවාලාභින්ට හොඳින් සවන්දීම.
- සුහදව පිළිතුරු සැපයීම.
- නියමිත ස්ථානය වෙත සේවාලාභීන් පහසුවෙන් යොමුකිරීම.
- වහාම සේවාලාභින්ගේ ගැටලුව වෙත යොමුවීම.
- සේවාලාභින්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා උපරිම උත්සහය දැරීම.
- සේවාලාභින්ට සුහද,සුවපහසු පරිසරයක් සකස් කරදීම.
- හැකි සෑම අවස්ථාවකම එක් වතාවකින් සේවා ලාභින්ගේ ගැටලු විසඳීම.
- සේවාලාභීන්ගේ ගරුත්වය සැමවිටම සුරැකීම.
- සේවාලාභින්ගේ කාලය අපතේ නොයැවීම

.

## 1.3 අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි.රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපී හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඩුවස් දෙව් රජුගේ අවධියේය. පඩුවස් දෙව් රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපී,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණිගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ටාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතු වළදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි.මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක “යෙ ඉමදිය පටමය අගනන ඉයීක තෙර මහිද තෙර තුබෙ ”යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨිය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිඳු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨිය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිඳු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි.

එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදි දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගැනිති.එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව “ අලෙවිය සඳහා පිටතින් බඩු

නොගෙන්විය යුතු බවට'' කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

05

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොළී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඈත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාම 05 නතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතුන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නිග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනිම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවීම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදි පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂි සිදුවීමක් විය.පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෲක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පලාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්ක වලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවිණි.

## 1.4 අම්පාර දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු

ගල්ඔය ව්‍යාපාරයත්, මහවැලි ව්‍යාපාරයේ සී කලාපයත්, ප්‍රමුඛ කොට ඇති අම්පාර දිස්ත්‍රික්කය භූගෝලීය සාධක අනුව වී ගොවිතැනට ඉතාමත් සුදුසු ප්‍රදේශයකි. රටේ වාර්ෂික වී නිෂ්පාදනයෙන් 20%ක් පමණ දායකත්වයක් දක්වන දිගාමඩුල්ල ගොවි පරපුර පිළිබඳ ආඩම්බරයෙන් සඳහන් කළ යුතුය. එසේම වී ගොවිතැනට අමතරව මෙහි ප්‍රධාන ජීවනෝපාය වන්නේ අතිරේක භෝග හා හේන් ගොවිතැනයි.සාමාන්‍යයෙන් වර්ෂයේ වැඩි කලක් වියළි දේශගුණයක් පවතින මෙම ප්‍රදේශයට වර්ෂාව ලැබෙන්නේ ඊසාන දිග මෝසමත් සමඟ දිස්ත්‍රික්යේ සාමාන්‍ය උෂ්ණත්වය පැරන්හයිට් අංශක 80ක් පමණ වන අතර , වාර්ෂික වර්ෂාපාතනය අඟල් 70ක් පමණ වේ. මධ්‍යම කඳුකරයේ නැගෙනහිර දෙසට වන ගල්ඔය කඳු පන්තිය මෙම දිස්ත්‍රික්කයේ බටහිර සීමාව සිසාරා දක්නට ලැබෙන අතර, සමහර තැනක අහස උසට නැඟුණු ශේෂ කඳු ද දක්නට ලැබේ. වර්තමානයේ පවා ඉතා අධික වන ගහනයක් පවතින අම්පාර දිස්ත්‍රික්කය වන සතුන් ගෙන් ද පොහොසත්ය. ඒ අතරින් ගල්ඔය ජාතිකවනෝද්‍යානය, අම්පාර අභය භූමිය, ලාහුගල ජාතික වනෝද්‍යානය හා බුද්ධංගල අභය භූමිය ගෙන දෙන්නේ දැඩි වමත්කාරයකි.

හෙක්ටයාර් 205,978ක් වූ ඉඩම් ප්‍රමාණයක් හා හෙක්ටයාර් 19280 ක් තරම් භූමි භාගයකට යට වූ අභ්‍යන්තර ජල තටාක වලින් සමන්විත වූ අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල, ද්‍රවිඩ , මුස්ලිම් යන ත්‍රිවිද ජාතීන්ම ජිවත් වේ. උතුරින් පොළොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්කවලටත් නැගෙනහිරින් ඉන්දීයන් සාගරයටත් දකුණින් හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක වලටත් බටහිරින් බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික්ක වලටත් මායිම් වන අම්පාර දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණයක් වර්ග කි.මී.4415කි.

අම්පාර ආගමික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ ඓතිහාසික වටිනාකමක් සහිත දිස්ත්‍රික්කයකි. පියංගල,බුද්ධංගල වැනි ආරණ්‍ය සේනාසන ද රජගල,දිඝවාපිය,මඟුල් මහ විහාරය, මුහුදු මහ විහාරය,නීලගල සෑය හා කුඩුම්බිගල වැනි පුරා විද්‍යා වටිනාකමක් ඇති ආගමික සිද්ධාස්ථාන ද ඒ අතරින් වැදගත් තැනැක් ගනී. එසේම මහඔය හා පදියතලාව ප්‍රදේශවල ඇති උණු දිය උල්පත් ආරුගම්බේ මනරම් මුහුදු වෙරළ තීරයත් කතරගම වන්දනා කරන බැතිමතුන්ගේ පාද වාරිකාවේ යෙදෙන මාර්ගයත් පිහිටා තිබීම මෙම ප්‍රදේශයට සංචාරකයින්ගේ පැමිණීම වැඩි කරවන සාධක වේ. එසේම දිස්ත්‍රික්කයේ තැන තැන දක්නට ලැබෙන (පොල්ලේබැද්ද, හේනානිගල) ආදී වාසී ගම්මානද පැවතිම වෙනත් දිස්ත්‍රික්කවලට වඩා වෙනස් වූ සංස්කෘතියක දායාදයක් ලැබීම මෙම දිස්ත්‍රික්කය අතිශයින් මනරම් වූ දිස්ත්‍රික්කයක් විමට හේතු වේ. එසේම අම්පාර දිස්ත්‍රික්කය කල්මුණ මහ නගර සභාව, අම්පාර නගර සභාව ඇතුළුව නාමල්ඔය, උහන , දමන, මහඔය, පදියතලාව, දෙහිඅත්තකණ්ඩිය, ලාහුගල. සම්මන්තුර, අක්කරපත්තුව, අඩ්ඩාලචේන, ආලයඩිවෙම්බු, තිරුක්කෝවිල්, නාවිදන්වෙලී, එරගම , නින්දවූර්. කාර්තිව් හා පොතුවිල් යන ප්‍රාදේශීය සභා 17කින් සමන්විත වන සේ සංවිධානය වී ඇත.

## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැඳී පවතී.බොහෝ දෙනෙකු මෙය හඳුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ වලින් සමන්විතය.

| අනු අංකය | දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ |
|---|---|
| 01 | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය |
| 02 | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය |
| 03 | සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය |
| 04 | දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය |
| 05 | රජයේ විගණන උප කාර්යාලය |
| 06 | මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 07 | දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය. |
| 08 | සංස්කෘතික හා ආගමික අංශය |
| 09 | දිස්ත්‍රික් ක්‍රීඩා අංශය |
| 10 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ඒකකය |
| 11 | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 12 | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය |
| 13 | සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 14 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය. |
| 15 | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්) |
| 16 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 17 | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය. |
| 18 | යළි පිබිදෙමු ව්‍යාපෘති කාර්යාලය |
| 19 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය |
| 20 | අපනයන සංවර්ධන මණ්ඩලයේ නැගෙනහිර කලාප කාර්යාලය |

## 1.6 කච්චේරිය යටතේ පාලනය වන වලට ග්‍රාම සේවා වසම්

කච්චේරිය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත.


| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දෙහිඅත්තකණ්ඩිය | 13 |
| 2 | පදියතලාව | 20 |
| 3 | මහඔය | 17 |
| 4 | උහන | 55 |
| 5 | අම්පාර | 22 |
| 6 | දමන | 33 |
| 7 | ලාහුගල | 12 |
| 8 | පොතුවිල් | 27 |
| 9 | තිරුක්කෝවිල් | 22 |
| 10 | ආලයඩිවෙම්බු | 22 |
| 11 | අක්කරපත්තුව | 28 |
| 12 | අඩ්ඩාලච්චේන | 32 |
| 13 | එරගම | 12 |
| 14 | නින්දවූර් | 25 |
| 15 | කාර්තිව් | 17 |
| 16 | සායින්දමාරුදු | 17 |
| 17 | කල්මුණ (මුස්ලිම් ) | 29 |
| 18 | කල්මුණ (දෙමළ) | 29 |
| 19 | නාවිදන්වේලි | 20 |
| 20 | සම්මන්තුර | 51 |

**1.7 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර |
|---|---|---|
| 1 | දෙහිඅත්තකණ්ඩිය | 160 |
| 2 | පදියතලාව | 84 |
| 3 | මහඔය | 60 |
| 4 | උහන | 12 |
| 5 | අම්පාර | - |
| 6 | දමන | 17 |
| 7 | ලාහුගල | 75 |
| 8 | පොතුවිල් | 83 |
| 9 | තිරුක්කෝවිල් | 40 |
| 10 | ආලයඩිවෙම්බු | 26 |
| 11 | අක්කරපත්තුව | 26 |
| 12 | අඩ්ඩාලච්චේන | 29 |
| 13 | එරගම | 12 |
| 14 | නින්දවුර් | 26 |
| 15 | කාර්තිව් | 23 |
| 16 | සායින්දමාරුදු | 26 |
| 17 | කල්මුණ (මුස්ලිම් ) | 30 |
| 18 | කල්මුණ (දෙමළ) | 30 |
| 19 | නාවිදන්වේලි | 36 |
| 20 | සම්මන්තුර | 20 |

# 1.8. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර

## සංවිධාන ව්‍යුහය



## 1.9 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.

- කාර්යාලයේ සාමන්‍ය පරිපාලනමය කටයුතු
- ආයතන කාර්ය ( ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කාර්ලයාලවල පරිපාලන කටයතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිළධාරින්ගේ පරිපාලන කටයුතු
- ආහාර පාලන කටයුතු
- වී මිළදී ගැනීම සඳහා සහය වීම.

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන හා සම්බන්ධිකරණ අංශයේ කාර්ය භාර්ය

- කාර්යාලයේ සාමන්‍ය පරිපාලන කටයුතු
- සමාජ සේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා ඵලදායීතාව නංවාලීමේ පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ටාර් වරුන් හා හදිසි මරණ පරික්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාම ලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- අවශ්‍යා අවස්ථාවලදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ සහයෝගය දිස්ත්‍රික්කයේ ජනතාවට ලබාදීම.
- ආපදා සහ සුනාමි ප්‍රතිසංස්කරණ රාජකාරි දෙපාර්තමේන්තුව කාර්යයන්
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

**1.10 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්ය මණ්ඩල සංයුතිය**

2016.01.01

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 සඳහා | | |
|---|---|---|---|---|---|
| | අනුමත සේවක සංඛ්‍යාව | නියුක්ත සේවක සංඛ්‍යාව | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | නියුක්ත සේවක සංඛ්‍යාව |
| දිස්ත්‍රික් ලේකම් | 01 | 01 | ප්‍රාදේශීය ලේකම් | 19 | 19 |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් | 01 | 02 | සහකාර ප්‍රාදේශීය ලේකම් | *20 | 18 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් | 01 | 01 | ගණකාධිකාරී | 19 | 18 |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | පරිපාලන නිළධාරී | 19 | 19 |
| | 01 | 01 | ග්‍රාම නිළධාරී පරිපාලන | 20 | 16 |
| ගණකාධිකාරී | 01 | 01 | රාජ්‍ය කළමණාකරන සහකාර | 504 | 499 |
| ඉංජිනේරු | 01 | 01 | පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 20 | 02 |
| පරිපාලන නිළධාරී | 01 | 01 | භාෂා පරිවර්ථක | 20 | 02 |
| රාජ්‍ය කළමණාකරන සහකාර | 25 | 37 | ග්‍රාම නිළධාරී | 503 | 485 |
| කාර්මික නිළධාරී | 02 | 02 | රියදුරු | 40 | 33 |
| සැලසුම් ශිල්පී | 01 | 01 | කාර්යාල සේවක සේවය | | |
| භාෂා පරිවර්තක | 02 | 01 | කාර්යාල කම්කරු | | |
| අයවැය සහකාර | 02 | 02 | සනීපාරක්ෂක කම්කරු | 161 | 140 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 01 | 01 | මුරකරු | | |
| රියදුරු | 03 | 11 | | | |
| කාර්යාල සේවක සේවය I | | 01 | | | |
| කාර්යාල සේවක සේවය II | 11 | 16 | | | |
| | | | | | |

.* කල්මුණ (දෙමල කොට්ඨාශය) උප කාර්යාලය සඳහාද වැඩ බැලීමේ පදනම මත එක් නිළධාරියෙකු සේවයේ යොදවා ඇත.

**1.11 අම්පාර දිසාපති කාර්යාලයට අයත් රජයේ නිවාස පිළිබඳ විස්තර**

| | | |
|---|---|---|
| අම්පාර A වර්ගයේ නිවාස | = | 03 |
| පොතුවිල් A වර්ගයේ නිවාස | = | 01 |
| අම්පාර B වර්ගයේ නිවාස | = | 10 |
| අම්පාර C වර්ගයේ නිවාස | = | 19 |
| අම්පාර D වර්ගයේ නිවාස | = | 35 |
| අම්පාර E වර්ගයේ නිවාස | = | 112 |
| අම්පාර සායනාගාර නිවාස | = | 17 |
| එකතුව | = | 197 |

| | | |
|---|---|---|
| උහන U/6 | = | 10 |
| උහන U/7 වර්ගයේ නිවාස | = | 19 |
| උහන MSQ වර්ගයේ නිවාස | = | 38 |
| එකතුව | = | 67 |

**අම්පාර නිවාස 197 + උහන නිවාස 67 = මුළු නිවාස ගණන 264**

## 1.12.අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ

## සංචාරක නිවාසය පිළිබඳ තොරතුරු

- ❖ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංචාරක නිවාසය, දිස්ත්‍රික් ලේකම්ගේ සෘජු අධික්ෂණය හා පාලනය යටතේ පවතී.
- ❖ සංචාරක නිවාසයේ වායු සමනය කරන ලද කාමර දෙකක්ද සහිතව කාමර 10 ක් ඇති අතර එහි 21 දෙනෙකු සඳහා සියළු පහසුකම් සපයා ඇත.

### 5.4 සංචාරක නිවාසයේ අය කිරීම සම්බන්ධ තොරතුරු

| කාණ්ඩය | කාමර සඳහා ගාස්තු | | |
|---|---|---|---|
| | වායු සමනය කල ඇඳන් 02ක් සහිතව | වායු සමනය කල ඇඳන් 03ක් සහිතව | වායු සමනය නොකල |
| A.රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් නිළධාරින් සඳහා | 400 | | 300 |
| B.වෙනත් අමාත්‍යාංශ,දෙපාර්තමේන්තුවලට අයත් නිළධාරින් සඳහා | 600 | | 500 |
| C.රාජ්‍ය නොවන ආයතනවල නිළධාරීන්ට හා පුද්ගලයින් සඳහා | 600 | | 500 |

මීට අමතරව රෙදිපිලි හා සේවා ගාස්තු වශයෙන් එක් අයකු සඳහා දිනකට රු.20.00 ක ගාස්තුවක්ද අය කරනු ලැබේ.

## 1.12 2015 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසයේ ආදායම් වාර්තාව

| 2015 වර්ෂය | |
|---|---|
| මාසය | ආදායම රු: |
| ජනවාරි | 120,550.00 |
| පෙබරවාරි | 59,300.00 |
| මාර්තු | 53,600.00 |
| අප්‍රේල් | 64,450.00 |
| මැයි | 48,900.00 |
| ජුනි | 81,700.00 |
| ජූලි | 68,000.00 |
| අගෝස්තු | 83,400.00 |
| සැප්තැම්බර් | 91,300.00 |
| ඔක්තෝම්බර් | 84,900.00 |
| නොවැම්බර් | 62,700.00 |
| දෙසැම්බර් | 70,400.00 |
| එකතුව | 889,200.00 |

# 2

# ජනගහනය

## 2.I අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ථ ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්

### ස්ත්‍රී පුරුෂ භාවය අනුව

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පිරිමි | | ගැහැණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | ගණන | % | ගණන | % | ගණන | % |
| 01 | අඩ්ඩාලච්චේන | 23,506 | 47.62 | 25,491 | 52.38 | 48,897 | 6.506 |
| 02 | ආලයඩිවෙම්බු | 12,736 | 47.76 | 13,166 | 52.24 | 25,902 | 3.458 |
| 03 | අක්කරපත්තුව | 21,456 | 48.98 | 22,381 | 51.02 | 43,837 | 6.052 |
| 04 | අම්පාර | 22,190 | 49.04 | 23,241 | 50.96 | 45,431 | 6.746 |
| 05 | දමන | 20,079 | 49.47 | 21,324 | 50.53 | 41,403 | 5.939 |
| 06 | දෙහිඅත්තකණ්ඩිය | 30,008 | 49.87 | 31,624 | 50.13 | 61,632 | 9.201 |
| 07 | ඉරක්කාමම් | 8,179 | 49.66 | 8,791 | 50.34 | 16,970 | 2.218 |
| 08 | කල්මුණ (මුස්ලිම්) | 24,603 | 48.37 | 26,061 | 51.63 | 50,664 | 6.868 |
| 09 | කල්මුණ ( දෙමළ) | 17,494 | 46.55 | 18,032 | 53.45 | 35,526 | 4.585 |
| 10 | කාර්තිව් | 9,478 | 47.66 | 9,407 | 52.34 | 18,885 | 2.589 |
| 11 | ලාහුගල | 4,900 | 49.03 | 4,953 | 50.97 | 9,853 | 1.373 |
| 12 | මහඔය | 11,519 | 50.79 | 11,719 | 49.21 | 23,238 | 3.196 |
| 13 | නාවිදන්වේලි | 11,643 | 46.33 | 11,209 | 53.67 | 22,852 | 2.881 |
| 14 | නින්දවූර් | 15,630 | 46.36 | 15,976 | 53.64 | 31,606 | 4.063 |
| 15 | පදියතලාව | 19,608 | 48.51 | 18,652 | 51.49 | 38,260 | 5.362 |
| 16 | පොතුවිල් | 14,633 | 48.17 | 14,394 | 51.83 | 29,027 | 3.921 |
| 17 | සායින්දමරුදු | 35,271 | 47.63 | 36,224 | 52.37 | 71,495 | 9.350 |
| 18 | සම්මන්තුර | 14,203 | 48.21 | 15,301 | 51.79 | 29,504 | 3.887 |
| 19 | තිරුක්කෝවිල් | 30,980 | 50.06 | 31,797 | 49.94 | 62,777 | 8.992 |
| 20 | උහන | 10,376 | 48.58 | 10,728 | 51.42 | 21,104 | |
| | එකතුව | **358,492** | | **370,471** | | **728,963** | |

මූලාශ්‍රය :- අම්පාර දිස්ත්‍රික් ජන හා සංඛ්‍යා ලේඛන අංශය

**2.2 අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ථ ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වයස් කාණ්ඩ අනුව - 2015**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මුළු ජනගහනය වයස | වයස් කාණ්ඩය | | |
|---|---|---|---|---|---|
| | | | 00-14 | 15-65 | 65< |
| 01 | අඩ්ඩාලච්චේන | 48,897 | 14,090 | 25,499 | 2,576 |
| 02 | ආලයඩිවෙම්බු | 25,902 | 6,330 | 14,408 | 1,673 |
| 03 | අක්කරපත්තුව | 43,837 | 12,564 | 3,801 | 2,858 |
| 04 | අම්පාර | 45,431 | 12,005 | 27,587 | 4,128 |
| 05 | දමන | 41,403 | 10,752 | 23,681 | 4,056 |
| 06 | දෙහිඅත්තකණ්ඩිය | 61,632 | 16,478 | 38,495 | 4,655 |
| 07 | ඉරක්කාමම් | 16,970 | 5,115 | 8,450 | 808 |
| 08 | කල්මුණ (මුස්ලිම්) | 50,664 | 13,944 | 27,188 | 3,377 |
| 09 | කල්මුණ ( දෙමළ) | 35,526 | 8,224 | 18,991 | 2,498 |
| 10 | කාර්තිව් | 18,885 | 4,931 | 10,504 | 1,346 |
| 11 | ලාහුගල | 9,853 | 2,502 | 5,776 | 622 |
| 12 | මහඔය | 23,238 | 5,849 | 13,426 | 1,440 |
| 13 | නාවිදන්වේලි | 22,852 | 5,999 | 11,364 | 1,309 |
| 14 | නින්දවූර් | 31,606 | 7,749 | 16,150 | 2,430 |
| 15 | පදියතලාව | 38,260 | 11,739 | 21,159 | 1,851 |
| 16 | පොතුවිල් | 29,027 | 5,270 | 11,644 | 1,295 |
| 17 | සායින්දමරුදු | 71,495 | 8,080 | 15,197 | 2,135 |
| 18 | සම්මන්තුර | 29,504 | 20,614 | 36,343 | 3,639 |
| 19 | තිරුක්කෝවිල් | 62,777 | 7,093 | 16,237 | 1,857 |
| 20 | උහන | 21,104 | 15,326 | 35,707 | 7,243 |
| | **එකතුව** | **728,963** | **264,237** | **403,251** | **61,475** |

මූලාශ්‍රය :- අම්පාර දිස්ත්‍රික් ජන හා සංඛ්‍යා ලේඛන අංශය

## 2.3 අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ථ ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්

**වයස් කාණ්ඩ අනුව - 2015**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මුළු ජනගහනය වයස | ජන වර්ගය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | ලංකා දෙමළ | ඉන්දියානු දෙමළ | මුස්ලිම් | බර්ගර් | මැලේ | වෙනත් |
| 01 | අඩ්ඩාලච්චේන | 48,897 | 2,218 | 942 | 16 | 38,948 | 30 | - | 11 |
| 02 | ආලයඩිවෙම්බු | 25,902 | 228 | 22014 | 9 | 22 | 129 | - | 9 |
| 03 | අක්කරපත්තුව | 43,837 | 165 | 35 | - | 39,016 | 7 | - | - |
| 04 | අම්පාර | 45,431 | 43,177 | 172 | 14 | 133 | 45 | 169 | 10 |
| 05 | දමන | 41,403 | 38,302 | 28 | 13 | 137 | 5 | - | 4 |
| 06 | දෙහිඅත්තකණ්ඩිය | 61,632 | 58,948 | 67 | 9 | 108 | - | 4 | 494 |
| 07 | ඉරක්කාමම් | 16,970 | 938 | 350 | - | 13,084 | - | - | 1 |
| 08 | කල්මුණ (මුස්ලිම්) | 50,664 | 124 | 66 | 8 | 44,306 | 1 | - | 4 |
| 09 | කල්මුණ ( දෙමළ) | 35,526 | 231 | 26564 | 50 | 2,376 | 490 | 1 | 1 |
| 10 | කාර්තිව් | 18,885 | 13 | 9891 | 1 | 6,753 | 203 | - | - |
| 11 | ලාහුගල | 9,853 | 8,253 | 645 | - | 1 | - | 1 | - |
| 12 | මහඔය | 23,238 | 20,655 | 15 | - | 42 | 2 | - | 1 |
| 13 | නාවිදන්වෙලි | 22,852 | 153 | 12101 | 2 | 6,399 | 9 | - | 8 |
| 14 | නින්දවූර් | 31,606 | 8 | 969 | 3 | 25,347 | 2 | - | - |
| 15 | පදියතලාව | 38,260 | 881 | 6581 | 4 | 27,213 | 3 | - | 67 |
| 16 | පොතුවිල් | 29,027 | 18,091 | 28 | 2 | 87 | - | - | 1 |
| 17 | සායින්දමරුදු | 71,495 | 5 | 17 | | 25,389 | - | - | 1 |
| 18 | සම්මන්තුර | 29,504 | 297 | 7178 | 18 | 53,114 | 1 | - | 1 |
| 19 | තිරුක්කෝවිල් | 62,777 | 100 | 25055 | 8 | 2 | 1 | 5 | - |
| 20 | උහන | 21,104 | 58,231 | 32 | 27 | 7 | 1 | 1 | 2 |
| | **එකතුව** | **728,963** | **272,063** | **130,017** | **186** | **325,151** | **946** | **183** | **615** |



මූලාශ්‍රය :- අම්පාර දිස්ත්‍රික් ජන හා සංඛ්‍යා ලේඛන අංශය

# 3

# කෘෂිකර්මාන්තය



## 3.1. අම්පාර දිස්ත්‍රික් කෘෂිකර්මාන්තය

ශ්‍රී ලංකාවේ සමස්ථ වී නිෂ්පාදනය සඳහා ප්‍රබල දායකත්වයක් අම්පාර දිස්ත්‍රික්කයෙන් ලබා දෙයි. අම්පාර දිස්ත්‍රික්කයේ බහුතරය කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කරගත් ප්‍රදේශයක් වීම එයට හේතුව ලෙස සඳහන් කල හැක. වී වගාවට අමතරව ආර්ථික බෝගයක් වශයෙන් උක් වගාව මහා පරිමාණ වශයෙන් මෙන්ම ගෙවතු වගා වශයෙන් එළවළු වගාවද කුළු බඩු භෝග වශයෙන් මිරිස් හා කහ වගාවද අතිරේක ආහාර බෝග හා ධාන්‍ය ද වගාකරනු ලබයි. දේශීය වී නිෂ්පාදනයෙන් 20% ක ප්‍රමාණයක් අම්පාර දිස්ත්‍රික්කයෙන් ලබාදීමට හැකිවීම දිස්ත්‍රික්කයක් වශයෙන් මහත් අභිමානයකි. දිස්ත්‍රික්කය පුරා පැතිරී ඇති මහා වාරිමාර්ග හා සුළු වාරිමාර්ග යනාදිය යොදා ගනිමින් ගොවීන් කෘෂිකර්මාන්තයේ නියැලෙන අතර, ඊට අමතරව සත්ව පාලනයද සිදු කරනු ලැබේ. ඒ යටතේ ගව, එළු හා කුකුල් පාලනය සඳහා විශේෂ තැනක් හිමිවේ.

<u>අම්පාර දිස්ත්‍රික්කයේ බහුල වශයෙන් වගා කරනු ලබන වී ප්‍රභේද</u>

| වී ප්‍රභේද | වයස් කාණ්ඩය |
|---|---|
| BG 94-1 | මාස 3 1/2 (සුදු දිග) |
| BG 403 | මාස 3 1/2 (සුදු දිග) |
| BG 358 | මාස 3 1/2 (සම්බා) |
| AT 307 | මාස 3 (බෝල) |
| BG 300 | මාස 3 (බෝල) |
| AT 362 | මාස 3 1/2 (දිග රතු) |
| AT 308 | මාස 3 (සම්බා) |

<u>අම්පාර දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක රජයේ ගොවිපලවල්</u>

- මල්වත්ත රජයේ ගොවිපල
- දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය, වාවින්න



## 3.2ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පවතින කෘෂිකර්ම සේවා මධ්‍යස්ථාන සහ කෘෂිකර්ම සංවිධාන - 2015

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සේවා මධ්‍යස්ථාන | ව්‍යාපෘති මධ්‍යස්ථාන | පොහොර ගබඩා | බීජ මධ්‍යස්ථාන | ගොවි සංවිධාන | | තරුණ ගොවි සමාජ | | භෝග නිෂ්පාදන සමිති | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | මධ්‍යස්ථාන | සාමාජිකයින් | මධ්‍යස්ථාන | සාමාජිකයින් | මධ්‍යස්ථාන | සාමාජිකයින් |
| **01** | දෙහිඅත්තකණ්ඩිය | 1 | - | - | - | - | - | | - | - | - |
| **02** | පදියතලාව | 2 | - | 1 | - | 14 | 5450 | 4 | 62 | 12 | 60 |
| **03** | මහඔය | 1 | - | - | - | - | - | | | - | |
| **04** | උහන | 3 | 1 | 3 | - | 17 | 3278 | | | 4 | |
| **05** | අම්පාර | 1 | - | - | - | 33 | 2573 | | | - | |
| **06** | දමන | 3 | 2 | 5 | - | 42 | 5667 | | | | |
| **07** | ලාහුගල | 1 | - | 1 | - | 8 | 85 | 6 | 30 | | |
| **08** | පොතුවිල් | 2 | 2 | 2 | 1 | 1 | 7 | 5 | 112 | | |
| **09** | තිරුක්කෝවිල් | 1 | - | 2 | | 2 | 3450 | | - | | |
| **10** | ආලයඩිවෙම්බු | 1 | 1 | - | | 33 | 4948 | | - | | |
| **11** | නින්දවූර් | 1 | 2 | - | 1 | 14 | 1857 | 3 | 105 | 6 | 150 |
| **12** | කාර්තිව් | 1 | - | 1 | | 4 | 451 | 1 | 15 | 3 | 45 |
| **13** | අක්කරපත්තුව | 1 | 2 | 1 | 1 | 32 | 350 | | - | - | - |
| **14** | අඩ්ඩාලච්චේන | | 4 | 2 | 1 | 25 | 4369 | 4 | 110 | 2 | 28 |
| **15** | සම්මන්තුර | 2 | 1 | 5 | - | - | 8127 | 2 | 63 | - | 150 |
| **16** | ඉරක්කාමම් | 1 | 2 | 1 | - | 15 | 2407 | 2 | 46 | 3 | 180 |
| **17** | නාවිදන්වේලි | 1 | 5 | 5 | 1 | 29 | 5280 | 2 | 30 | 20 | 600 |
| **18** | සායින්දමරුදු | 1 | 1 | 1 | - | 2 | 143 | 2 | 60 | 5 | 148 |
| **19** | කල්මුණ (මුස්ලිම්) | 3 | 1 | 1 | 1 | 7 | 318 | 1 | 30 | 3 | 100 |
| **20** | කල්මුණ ( දෙමළ) | 3 | 1 | 1 | 1 | 6 | 263 | 1 | 30 | 3 | 100 |
| | එකතුව | **32** | **25** | **32** | **7** | **284** | **49923** | **33** | **693** | **61** | **1561** |

**3.2අම්පාර දිස්ත්‍රික්කයේ වී අස්වැන්න පිලිබඳ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රමාණය අක්කර වලින්**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වගා කරන ලද අක්කර ගණන වාරිමාර්ග | | | |
|---|---|---|---|---|---|
| | | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාව මගින් | එකතුව |
| 01 | දෙහිඅත්තකණ්ඩිය | - | - | - | - |
| 02 | පදියතලාව | 187 | 504 | 6382 | 7074 |
| 03 | මහඔය | 511 | 579 | 7790 | 8880 |
| 04 | උහන | 20762 | 934 | 2581 | 24277 |
| 05 | අම්පාර | 6252 | 492 | 913 | 7658 |
| 06 | දමන | 12185 | 463 | 3371 | 1619 |
| 07 | ලාහුගල | 1967 | 1387 | 2212 | 5567 |
| 08 | පොතුවිල් | 6157 | 1959 | 6279 | 14396 |
| 09 | තිරුක්කෝවිල් | 3993 | 3290 | 5430 | 12713 |
| 10 | ආලයඩිවෙම්බු | 14482 | - | 1883 | 16365 |
| 11 | නින්දවූර් | 7139 | - | - | 7139 |
| 12 | කාර්තිව් | 1201 | - | - | 1201 |
| 13 | අක්කරපත්තුව | 10567 | - | 164 | 10731 |
| 14 | අඩ්ඩාලච්චේන | 7321 | - | 970 | 8292 |
| 15 | සම්මන්තුර | 22479 | - | 194 | 22673 |
| 16 | ඉරක්කාමම් | 5062 | 337 | 750 | 6149 |
| 17 | නාවිදන්වෙලි | 8983 | - | - | 8983 |
| 18 | සායින්දමරුදු | 341 | - | - | 341 |
| 19 | කල්මුණ (මුස්ලිම්) | - | - | - | - |
| 20 | කල්මුණ ( දෙමළ) | - | - | 30 | 30 |
| එකතුව | | **129592** | **9947** | **38952** | **178493** |

මූලාශ්‍රය :- අම්පාර දිස්ත්‍රික් ජන හා සංඛ්‍යා ලේඛන අංශය

## 3.2. අම්පාර දිස්ත්‍රික්කයේ අතිරේක භෝග වගාව පිළිබඳ තොරතුරු

අස්වනු ප්‍රමාණය ( (කි.ග්‍රෑ. වලින්)

| අනු අංකය | අතිරේක බෝගයේ නම | කාලය | | | | | |
